# රස්තියාදුකාර ආදරය

03

(අවසාන කොටස🐼💓)

"අනේ මැණික අඩන්නෙපා බං🥺🥺🥺...ඔහොම තමයි ජීවිතෙ..ප්‍රශ්න එනවා..අපි ඒවට මූණ දෙන්නොනෙ...🥺

අනික අම්මලා බලකරන්නැනෙ බං...උබ ඒකා මොකා උනත් අකමැති වෙයන්...මොකක් හරි ඇදයක් කියලා😌...

කෝ..කෝ..දැන් අඩන්නෙපා...හැටි බලපන් මූණේ😂💔🖐...."

"ම්ම්ම්ම්🥺"

බිනූ හදන්නෙ කොහොමහරි මගෙ හිත හදන්න...🥺එයා දන්නවා එයා මගෙ හිත හදන්න කොච්චර try කරත්...මන් ආයෙ තනි උන ගමන් ඒක ගැනම හිත හිත අඩනවා කියලා😟...ඔව් ඒ මගෙ හැටි...හිතට ලොකු දුකක් දැනුනහම මන් කරන්නෙ මට ඇති තරම් අඩන එක😶....මන් පුලුවන් තරම් මගෙ හිතම රිද්දගෙන ඇති වෙනකල් අඩනවා....

විනාඩි කීයද පැය කීයද මට වැඩක් නෑ...😐

බිනූටත් නිදාගමු කියලා..මාත් නිදාගන්න ඇදට ආවා..මගෙ ඔලුව පුපුරන්න වගෙ කැක්කුමයි...පෙනඩෝල් දෙකක්වත් නොබී හිටියෙ මට ඒ වේදනාව දරාගන විදවන්න ඕන උනු නිසා...මන් එහෙම්ම කොට්ටෙත් බදාගෙන ආයෙත් ඇඬුවා...😭..

අඩ අඩාම මට නින්ද ගිහින් මන් හිතන්නෙ...

"සශී...සශී..නැගිටපන්...9යත් පහුවෙලා😒..."

මන් අමාරුවෙන් ඇස් දෙක ඇරගත්තා. ඇස් දෙකත් හොදටම රිදෙනවා..ඊයෙ ගොඩක් වෙලා අඬපු නිසාද කොහෙද....☹

"මෙ බලපන්කො මූණත් තඩිස්සි වෙලා...ඇස් දෙකත් රතු වෙලා...උබ ආයෙ ඇඬුවා නේද ඊයෙ නිදාගන්නවා කියලා ඇවිල්ලා..😒"

"😢ඇයි බන් මෙහෙම වෙන්නෙ මට....මන් දැන් ඔය එන එකාට අකමැති උනා කියමුකො..ඒත් කවදහරි මට වෙන එකෙක් එක්ක යන්න වෙනවනෙ😢😦.....මට බෑ බන්...එහම...."

"හරි හරි..දැන් ආයෙ අඬන්න හදන්න නං එපා මට කදුලු ගංගා වල පීනලා හුරු නෑ හරිද😒🖐"

මට ඒකටනං හිනා ගියා😅...

"අප්පේ ඇති යන්තම් හිනා උනා..😮වෙලාවට අද දවස free උනේ...ආ මේ එකනෙවෙ කෝ උබේ ෆෝන් එක😫"

"ආ...ඊයේ කොහෙද මන් තිබ්බෙ ඒක🤷‍♀️...අයියො ඔක්කොම අමතක වෙනවනෙ..."

"හා...හා..මේ තියෙන්නෙ😒..සෝපාවට විසික් කරපු පාර ඒක එතනමයි...සිහියක් පතක් නෑනෙ...උබ මූණ හෝදගෙන හිටපම් මන් අර පල්ලෙ කඩේට ගිහින් ඉදිආප්ප මුල් දෙකක් ගේන්නම් කන්න🙂🤗"

"හරි බං පරිස්සමෙන් ගිහින් වරෙන්♥️.."

කියලා මන් wash එකක් එහෙම දාගෙන ඇවිත්...ෆෝන් එක බැලුවා..😳

මිස් කෝල් 10යි...😳

ඔව් ඔව් මගෙ ආරක්ෂකයගෙන් තමා😂....

මෙච්චර ඇයි මං ගැන හොයන්නෙ...ඇත්තට වෙන වැඩක් නැද්ද මන්දා...😆

මං ගැන එයාගෙ හිතේ මොකක් හරි අදහසක් තියෙනවා කියලා නම් දැනුනා...😊ඒත් මට තාම මොකුත් කීවෙ නෑ..😊

සෝ...මන් අහන්න ගියෙත් නෑ😏✋.

මන් උදේම එයාට කෝල් එකක් අරන් අපෙ අම්මා කියපු විස්තරේ එයාටත් කීවා🙂...මන් ඔය විස්තරෙ කියන්න කලින් කෝල් එක ආන්සර් කරපු ගමන්ම මට බනින්න පටන් ගත්තෙ නැතෑ...😒

"මොකද තමුසෙ කටවහගෙන ඉන්නෙ..මන් කොච්චර බය උනාද💔..."

"මන් කතා කරන්නෙ කොහොමද ඔයා ඔහොම කෑගහනකොට😒...ඔක්කොටම කලින් වෙච්ච දේවත් ඇහුවද...මට බනින්නෙ😠"

"හරි හරි දැන් කියනවකො මොකද උනෙ කියලා?"

"අයියේ..අනෙ..අපේ අම්මලා??..............................................................................."

මන් සීන් එක කීවා...එයාට ගොඩක් දුක හිතුනා වගෙ...?මගෙ හිතත් හදලා මට කීවෙ මගෙ හිතට ඇල්ලුවොත්...මන් බලාපොරොත්තු වෙන විදිහෙ කෙනෙක්නම් මට කැමති තීරණයක් ගන්න කියලා...?

මාත් ඉතින් ඕවට හූමිටි තිය තිය හිටියා..☺

අපේ කැම්පස් එකෙ එක්සෑමුත් ඉවර උනා...හෙට අපි අපේ ගම්වලට යනවා....ආයෙ සතියකින් තමයි කැම්පස් එකට එන්න කියලා තිබුනේ...ඒ අපේ Degree Ceremony එකට....😍❤

බිනූයි මමයි කෝච්චියෙන් ඇවිත් බැහැලා station එක ළග හිටියා...අපිව ගන්න සදුන් අයියා ඇවිත් හිටියා...ඒ වෙනකොට එයා Engineer කෙනෙක්😉...දෙපැත්තෙන්ම මේ කසාදෙටනම් උඩින්ම කැමති🙊💓...

අපේ ගෙදරින් මාවා දාලා ඒ දෙන්නා බිනූලගෙ ගෙදර ගියා...

මාව දැක්ක ගමන් අම්මා ඇවිත් මාව බදාගත්තා...

"අප්පේ....සුදු මැණිකෙව දැක්ක කල්...."

ඒ මගෙ පුංචි...😘එයා මගෙ දෙවෙනි අම්මා වගේ...ඒ තරම් ආදරෙයි මට...එයා මැරි කරලා එයාට දැන් බබාලා දෙන්නකුත් ඉන්නවා...😮එක්කෙනෙක්ට අවු.4යි අනික් කෙනා බණ්ඩියෙ....

"කෝ අම්මා අප්පච්චියි නංගියි☺..."

දෙන්නම පේන්න නැති හින්දා මන් ඇහුවා...👀

"ඕං දූරියන් ගහේ ගෙඩි හැදිලා කියලා ඔයා කන්න ආස හින්දා වත්තට ගියා කඩාගෙන එන්න කියලා😯..."

"ශා මරුනෙ□□□....පට්ට පට පට😋"

මන් නාගෙන එහෙම එළියෙ බංකුවට වෙලා කල්පනා කර කර හිටියා..එතකොටම අප්පච්චි නංගිත් ආවා..□□

මන් දුවගෙන ගිහින් අප්පච්චිගෙ ඇගේ එල්ලුනා😁....

"හා හා ඉන්න කපලා දෙනකල්😂❤□"

හි හි...එයා දැනගත්තා වැඩේ.....මායි අප්පච්චි විතරයි දූරියන් කන්නෙ..අපි දෙන්නා ලොකුවට ඉදිලා තිබුන ගෙඩි දෙකකටම වැඩේ දුන්නා😋😋..

හවස් වෙලා නංගි කාමරේට ආවා..(එයත් AL ලියලා result එනකල් ඉන්නෙ මේ දවස්වල😎)

"මේ අක්කේ👀..."

"ම්ම්ම්🙂..."

"හෙට එනවලු නේද ඔයාව බලන්න මනමාලයෙක්😏"

"හ්ම්ම්😒...."

"ඔයා දැකලා තියෙද එයාව?"

"නෑ..😏"

"ඔයා කැමති නෑ වගේ මනමාලයා එනවට😛"

"ඔව් මන් කැමති නෑ...ඔයා දන්නවනෙ මං ගැන...😟...මට එයාව නැතුව වෙන කාටවත් ළං වෙන්න බෑ නංගි😏.."

"බලමුකො බලමුකො හෙට කොල්ලව දැක්කම ඔය කතා කියන එකක් නෑ😏"

"අනෙ පලයන් බන් යන්න😒...ලස්සන, සල්ලි වලින් ඇති වැඩක් නෑ....එතන ආදරයක් නැත්නම්😟..."

"මේ..දැන් හොටු පෙරාන අඩන්නෙපා හරිද...හෙට ලස්සනට ඉන්නෙපැයි...බය නොවී ඉන්නවකෝ...😌...දැන් නිදාගන්න...ගුන්නයිට්😘"

කියල මේකි ගියා කාමරෙන් එළියට...😄

හුම්ම්ම්.

හෙට වෙන දේකට මූණ දෙනවා කියලා මාත් නිදාගත්තා...😔😔

"අක්කෙ..නැගිටනව හලෝ😒...තමුසෙ ඔහොම පෙරේතයා පොලෙ ගැහුවා වගේ නිදාගත්තහම හරිද අද වගේ දවසක😌"

කන ගාව කෑගහනවා ඉතිං😒💔...නිදාගන්නවත් නෑනෙ ගෙදර ඉදලත්...

මම නාලා එහෙම ඕනවට එපාවට වගේ සාරියකුත් පටලෝගත්තා😒...

මොනවගේ එකෙක්ද කොහෙ මනුස්සයෙක්ද...වයස, පාට ඔය කිසි දෙයක් මන් ඇහුවෙ නෑ අම්මලගෙන්😑...මට එහෙමවත් උවමනාවක් තිබ්බෙ නෑ මේක ගැන😒.

"පුතේ අර ළමයා එහෙම එනව වගේ😌...අපි කියනකල් එන්නෙපා එළියට😁..."

කියලා අම්මා එලියට ගියා..

මොන සාප වැඩද මන්දා මේවා..දැන් අර එන හෝතඹුවට මන්
මේ හෙප්පුව දික් කරන්නත් එපෑ...😒

මොංගල් වගේ හැසිරුනානං හරි😌...එතකොට ආපු පයින්ම
යන්නැතෑ....??

කාර් එක්ක සද්දයක් තමා ඇහුනේ....?

කච්චිය ගෙට ඇවිල්ලා..අපේ අම්මලා එක්ක හෙන කයිය...අවුරුදු
ගානකට කලින් දන්නවා වගේනේ කතාව😒💔...

ඔය අස්සෙ තරුණ ටිකක් ගොරෝසු කටහඬකුත්
ඇහෙනවා....ඒක හුරුයිත් වගෙ....?✊

මන් ඕවා කල්පනා කර කර ඉන්නකොට...අපේ අම්මයි නැන්දායි
ඇවිල්ලා මගෙ අත් දෙකෙන්ම අල්ලන් මාව වඩම්මන්න ලෑස්ති
වෙනවා?...

"අනෙ අම්මා මට තනියම යන්න පුලුවන්😒"

"කටවහගෙන යං ළමයෝ"

කියලා ඕං සාලෙ මැද අතෑරියා...?

මන් දිහා හැමෝම බලාගෙන�...මට එවෙලෙ දැනුනෙ නිකං ඇදුම් නැතුව පිරිසක් ඉස්සරහ ඉන්නවා වගේ හැගීමක්😕.

"බිම බලාගෙන ගිහින් කලු සපත්තු දාලා හිටපු කෙනා ළග මන් නැවතුනා�..."

එයාත් නැගිට්ටා එතකොටම,මන් හෙප්පුව දීලා මූණවත් බලන්නැතුව දණ ගහලම වැන්දා😒💔.

"තෙරුවන් සරණයි😇❤□"

දෙයියනේ ඒ කටහඬ😮...

මන් ඒත් එක්කම එයා දිහා බැලුවා....😯😯

මොකක්...😮

මේ මොනවද වෙන්නෙ..😳

මට නිකන් කලන්තෙ වගේ...😏

මේක වෙන්න පුලුවන්ද මන් අහන්නෙ...😶

දෙයියනේ මගෙ මොළෙ මෙච්චරටම නරක් වෙලාද...�

ඇයි මේ මෙයා මෙතන...�

මන් කෝකටත් කියලා ශේප් එකෙ මගෙ අතම මිරිකගත්තා..�

"අහ්..."   ඒක මට රිදුනා...�

"ඇයි☺..."

"නැ...මේ..නිකං�"

එයා...😍😍ඔව් එයා තමයි�❤

මගෙ ක්‍රශ් එක...�😍.... ඒ මූණ කොහොම අමතක වෙන්නද...🙈♥

එයා තවත් handsome වෙලානෙ🙈💓...රැවුළත් වැවිලා�....

මන් වශී වෙලා වගේ බලාන හිටියා..🙊✿

"දෙන්නට දැන් කතා කරන්න ගොඩක් ඒවා ඇතිනේ නේද...😊එළියට ගිහින් කතා කරානං දෙන්නම"

කියලා අපේ අම්මා කීවා...�

ඒත් එක්කම

"අපේ කොල්ලට නැතත් දුවටනම් ප්‍රශ්න ගොඩක් ඇති අහන්න😁" කියලා මගේ ක්‍රෂ් එකගෙ අම්මා කීවා...�

••••••••••••••••••••••••••••••••••••

මන් එයාව දැකපු දවසෙමයි එයාට මාව නෝටි වෙලා තියෙන්නෙත්...🙊එදා ඉදන් මන් ගැන හැම දෙයක්ම වගේ හොයලා...එයා එදා හිටියෙ රස්තියාදු කල්ලියෙ තමයි...මන් ගැන හොයාගත්තට පස්සෙ එයා දැනගෙන මන් Campus select කියලා...�තොරතුරු හම්බෙලා තියෙන්නෙ වෙන කොහෙන්වත් නෙවෙ..මගෙ පොඩි මස්සිනාගෙන්...�අපෙ නංගිගෙ Boyfriend...එයා මගෙ වයස....😁මායි නංගි එකට යනවයි...නංගියි මස්සිනා පොඩ්ඩයිත් ගමන් යනවයි මෙයා දැකලා..�දවසක් අහලා..ඔහොම තමා මන් ගැන ගොඩක් තොරතුරු දැනගෙන තියෙන්නෙ...😎

එදා ඉදන් එයා හොද ජොබ් එකක් හොයන්න ගත්තා..�මොකද එයා හිතලා රස්තියාදුකාරයෙක්ට අපෙ අම්මලා මාව දෙන

එකක් නෑ කියලා..�එයා ඊටපස්සෙ CID POST එකට apply කරලා....👤AL පාස් නිසා එයාට ඒකට යන්න පුලුවන් වෙලා...😇එතනින් අත්දැකීම් අරගෙන ටිකෙන් ටික එයාගෙ මහන්සියෙන් දැන් එයා Colombo වල ඉන්න Best CID Officer වෙලා...🗣එතකොට මෙයා ගැන  තමයි එදා News වලටත් කීවෙ....😎

අා..🙊

එතකොට මෙයාගෙන් නම🙈 සසිදු ආකේශ් දිසානායක.මට වඩා අවුරුදු හතරක් වැඩිමල්...� ඒ වගේම මෙයා තමයි මගේ ආරක්ෂකයා වෙලා මට හොරෙන් මන් ගැන හොයලා බැලුවෙත්....😢😢මට බැන බැන මන් ගැන හැම වෙලේම වද වෙලා තියෙන්නෙත් මෙයාමයි�💓...

ඔව් එදා මට ඔය විස්තරේ කියනකොට අදහගන්න බැරි උනා�❤️...ඒ තරම් ආදරයක්...මන් වෙනුවෙන්��....

මගෙ Degree Ceremony එකෙන් මාස 6කට පස්සෙ අපි දෙන්නා marry කරා😍😍❤️....මගෙ සතුට කියාගන්න වචන නෑ����❤️.

ඒ වෙනකොට නංගිගෙ Result ඇවිත් තිබුනා..එයා AL Bio කරේ....එයාට A3යි🎉 පේරාදෙණිය campus select වෙලා තිබුනා...එකෙම තමා මගෙ පොඩි මස්සිනත් හිටියේ...�😜....

බිනූ සදුන් අයියව marry කරලා දෙන්නම France ගියා...♥️♥️

මම මගේම කියලා Private Company එකක් පටන් ගත්තා...🌀

❤️ *Crush* ❤️

ඔව්😇

ඒකතමයි ඒකෙ නම...😍

සියලුම පාසල් උපකරණ නිශ්පාදනය කරන Company එකක්...😇සේවක සේවිකාවො 10000ක් විතර මන් යටතේ වැඩ කරා.....ඒ හැමෝටම එයාලගෙ මැඩම් නෙවෙ හොදම යාලුවෙක් වෙන්න මට පුලුවන් උනා...

ආකේශ් නම් කියන්නෙ ඒ මගෙ හිත හොද නිසා කියලා..🙈💓...

එයාත් එයාගෙ වැඩ කටයුතු සාර්ථකව කරගෙන ගියා....😍අවුරුදු දෙක්කින් අපේ පවුලට අලුත් සාමාජිකයෙකුත් ආවා...❤️එයා නලිදු නිමේෂ්....ඒ ඉන්නෙ මගෙ පන...ඔව් ඒ අපේ චූටි චණ්ඩියා...අප්පච්චි වගේම තමයි😘.......

කොහොමහරි මන් ආස කරපු, මගේ හීනෙ හිටපු, මගෙ#රස්තියාදුකාර ආදරය# මගෙම උනා❤️.

.

.

.

අවසානයි🐼💓

.

.

.

◈◈◈◈◈◈◈◈◈◈◈◈◈◈◈◈◈◈

අපිට ලැබෙන්න තියෙනම් දෙයක්,ඒ දේ මොන ක්‍රමේකින් හරි අපිට ලැබෙනවා...☺♥□

අපිට දෙයක් නොලැබෙන්න තියෙනම්....ඒ දේ අපි ළං කරගන්න කොතරම් උත්සහ කෙරුවත්...අපිට මගහැරෙනවා...☺🥀

එහෙම තමයි ජීවිතෙ✿...

ඉතින්, කවදාවත් ඉක්මන් තීරණ ගන්නෙපා....☺අපිට අවශ්‍ය අපිට ලැබෙන්න තියෙන දේ දවසක ලැබෙනවා..ඉවසන්න🐼💓..

ඔයා ආදරේ කරන ඔයාගෙ ආදරය ඔයාටම දවසක ඔයාගෙම කරගන්න පුලුවන් වෙන්න කියලා මන් ප්‍රාර්ථනා කරනවා□💝.

සතුටින් ඉන්න හැමදාම✿

අලුත් කතාවක් අරගෙන ආයෙත් එන්නම්✨

මුල ඉදලම මේ කතාවට ගොඩක් Comments හම්බුනා.Comments එවපු ඔයාලට ගොඩක් Thank u❤️...ආදරෙයි ඔයාලට...ඉතින් මේ කොටස ගැනත් කියලා Comment එකක් දාගෙන යන්න...ඒක මට ගොඩක් වටිනවා.